**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2014**

**ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

1.3 **විගණකගේ වගකීම**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට** (ISSAI 1000-1810) **අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා** 1971 **අංක** 38 **දරන මුදල් පනතේ** 13 **වගන්තියේ** (3) **සහ** (4) **උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුකූලව අස්තිත්වයන් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදුවී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයන්ට අදාළව කරන ලද ගැලපීම් රු. 2,978,856 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුකූලව ශේෂපත්‍ර දිනෙන් මාස 12 ක් ඇතුළත නිරවුල් කළයුතු අයිතමයන් පමණක් ජංගම වගකීම් යටතේ පෙන්නුම් කළයුතු වුවත්, නිරවුල් කළයුතු කාලය වර්ෂ 05 ක් ඉක්මවූ එකතුව රු. 90,000 ක් වූ නිරවුල් කළයුතු ශේෂ ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.**

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හා 92 වගන්තිය අනුව තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන නමුත්, ක්ෂය කිරීමෙන් ශුන්‍ය අගයට පත්ව ඇති රු.337,026,080 ක් ගත් මිල වූ වත්කම් අයිතම් 13 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට හා ඒ සඳහා ක්ෂය ගැලපීමට කටයුතු කර නොතිබුණි.**

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය මගින් අන්තර්ජාල පිවිසුම් වේගය වැඩිකර ගැනීමට සවිකරන ලද මෘදුකාංගය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.408,160 ක් ගෙවීම් කර තිබුණද, එම වටිනාකම පරිගණක හා මෘදුකාංග යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ ගැනීම වෙනුවෙන් 2015 වර්ෂය තුළ ආයතන 02 ක් වෙත රු. 42,400 ක් ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඒ වෙනුවෙන් වෙන් කිරීම් කර නොතිබුණි.**

(ඇ) ජාතික මූලික අධ්‍යයන ආයතනයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් පාරිතෝෂික සඳහා හිමිකම් නොලබන නිලධාරීන් දෙදෙනකු සඳහා රු. 497,908 ක් පාරිතෝෂික වෙන්කිරීම් කර තිබුණි.

(ඈ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන් මහවැලි අධිකාරියට අයත් නිල නිවාසවල පදිංචි වී සිටීම වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු. 129,750 ක නිහ නිවාස කුලී එම අධිකාරියට ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී අවශ්‍ය වෙන්කිරීම්ද කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන ගිණුම්කරන ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබූ අතර එම ප්‍රදාන උපයෝගී කර ගනිමින් වර්ෂය තුළදී රු. 2,535,979 කට මිලදී ගත් දේපළ පිරියත හා උපකරණවලට අදාළ ක්ෂය ක්‍රමක්ෂය කිරීම වෙනුවට සම්පූර්ණ පිරිවැය සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

**2.2.3** නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අතර රු.1,444,530 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4** විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 80,437,405 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ණයහිමියන් | 90,000 | ශේෂ තහවුරු |
| (ආ) | නියෝජිත ශේෂය | 17,405 | වටිනාකම තහවුරු කරන ලිපි |
| (ඇ) | කෙරීගෙන යන වැඩ | 80,000,000 | මිණුම්පත්, කළ වැඩ පත්‍රිකා |
| (ඈ) | පස් පරීක්ෂාව | 330,000 | පස් පරීක්ෂණ වාර්තා |
| | | 80,437,405 | |

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ
------------------------------------

ආයතනයේ සිදුකර තිබූ ඉදිකිරීම් 05 ක් වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවන ලද අත්තිකාරම් මුදල්වලින් ආයතනයට අය විය යුතු රු. 1,782,802 ක අත්තිකාරම් ශේෂයක් 2012 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4** නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය | අධ්‍යයන දීමනා ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ කර නොගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි කළමනාකාරීත්වය කටයුතු කිරීම හේතුවෙන් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඉහත අරමුදල්වලට අතිරේකව ගෙවන ලද මුළු මුදල රු. 2,769,992 ක් විය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2.2 සහ 12.5.2 වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ ස්වකීය තනතුරට වඩා ඉහළ තනතුරක වැඩ බලන නිලධාරියකුට ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ගෙවීම් කිරීම හේතුවෙන් රු.30,557 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | i. මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 කට වැඩි එකතුව රු.9,534 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | ii. මුදල් රෙගුලාසි 1645 | දෛනික ධාවන සටහන් පිළියෙල කර නිතිපතා පරීක්ෂා කර නොතිබුණි. |
| | iii. මුදල් රෙගුලාසි 1646 | ඊළඟ මාසයේ 15 වන දිනට ප්‍රථම දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශවල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | iv. මුදල් රෙගුලාසි 1647 (ඇ) | එක ස්ථානයක වාහන 03 ක් හෝ ඊට වැඩි ගණනක් ඇතිවිට, කලක් නොපවත්නාවූද, ලොග් පොතෙහි සටහන් නොකරනු ලැබුවාවූද, සියලුම ද්‍රව්‍ය මිලදී ගැනීම් හා නිකුත් කිරීම් පිළිබඳ ලේඛනයක් තබාගත යුතු වුවද, ආයතනය සතුව වාහන 10 ක් පැවතියදී එවැනි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | v. මුදල් රෙගුලාසි 1647 (ඉ) | ආයතනයේ වාහන 10 ක් ඇතත්, සියළු විස්තර ඇතුළත් කර වාහන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | **1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | **ආයතනය සතුව පැවති රු.328,333,310 ක ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.** |
| (ඉ) | **1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | **ආයතනය සතු වාහන 04 ක් සඳහා ඉන්දන දහනය මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණු අතර, වර්ෂය තුළ ඉන්දන වශයෙන් රු. 1,080,837 ක් වැය කර තිබුණි.** |
| (ඊ) | **2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 වගන්තිය** | **චක්‍රලේඛයට පටහැනි ලෙස ආයතනයට තාවකාලික නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ ආයතන අරමුදලින් එකතුව රු.962,075 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.** |
| (උ) | **2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | **වටිනාකම රු.20,424,482 ක පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද, එසේ නඩත්තු කර නොතිබුණි.** |
| (ඌ) | **2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**<br>**(i) 7.4.1 වගන්තිය** | **අභාවිත තොග හා සෙමෙන් චලනය වන තොගවල වයස් විශ්ලේෂණයක් සකස් කළයුතු වුවද, එවැනි වයස් විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි.** |
| | **(ii) 09 වගන්තිය** | **මානව සම්පත් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.** |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**----------------------------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 අප්‍රේල් 11 දිනැති අංක ඩීඑම්එස්/ඊ2/62/7/277 හා 2014 නොවැම්බර් 05 දිනැති අංක ඩීඑම්එස්/1608 දරන චක්‍රලේඛවලට අනුකූල නොවන ලෙස විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.5,048,911 ක් ගෙවා තිබුණි.**

**(ආ)** **භාණ්ඩාගාර ලේකම්ගේ 2011 අප්‍රේල් 29 දිනැති අංක PED/POL/2 දරන චක්‍රලේඛයේ 02 ඡේදයට අනුකූල නොවන පරිදි කළමනාකරණ මණ්ඩලයේ පර්යේෂණ සභාවේ ලේකම්වරියට සහ වැඩ සහායකට එකතුව රු. 29,500 ක දීමනාවන් ගෙවා තිබුණි.**

**(ඇ)** **අතිකාල ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර අතිකාල සේවා සඳහා අවශ්‍ය අනුමැතිය විධිමත්ව ලබාගෙන නොමැති අතිකාල ඉල්ලීම් සඳහා රු.3,615,361 ක මුදලක් ගෙවා තිබුණි.**

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.21,133,791 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.25,768,370 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,634,579 ක වර්ධනයක් පෙන්නුම් කෙරුනි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පෞද්ගලික පඩිනඩි සහ වේතන, සැපයුම් සහ සේවා වියදම්, නඩත්තු වියදම් සහ අනෙකුත් වියදම් පිළිවෙලින් රු.7,722,580, රු.6,566,015, රු.4,694,443 සහ රු.4,281,863 කින් වැඩිවී තිබුණද ඊට වඩා වැඩි වේගයකින් පුනරාවර්තන ප්‍රදාන සහ අනෙකුත් ආදායම් පිළිවෙලින් රු.27,373,000 කින් සහ රු .3,214,404 කින් වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව සියලුම දැන්වීම් භාෂාත්‍රයෙන් පළ කළ යුතු වුවද අවස්ථා 06 කදී පර්යේෂණ සහකරුවන් බඳවා ගැනීමට අදාළ දැන්වීම් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ කර තිබුණි.

(ආ) 1986 වර්ෂයේ සිට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පදිංචිය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දිගන නිලගම නිල නිවාස 06 ක් ලබාගෙන තිබුණත්, 2015 මාර්තු 31 දින වන විටත් දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඇ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, දැනටමත් අපහරණය කළ යුතු භාණ්ඩ හඳුනා ගෙන ඇත්නම් 2(අ) ප්‍රකාරව කටයුතු කිරීම සඳහා 03 වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලය දී තිබියදීත් 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් හඳුනා ගෙන තිබුණු පාවිච්චි නොකරන ලද රු. 1,389,076 ක් වටිනා වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ අර්ථසාධක අරමුදල් ව්‍යවස්ථාවේ 28 වගන්තිය ප්‍රකාරව, එම අරමුදලේ ගිණුම් සෑම ලිත් වර්ෂයක් පාසාම සකස් කර, ගිණුම් පරීක්ෂණයකට භාජනය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලේ ගිණුම් විගණන දිනය වූ 2015 අප්‍රේල් 01 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේදී ආයතනය සතු ශුද්ධ වටිනාකම රු.24,915,351 ක්වූ රසායනාගාර උපකරණ, මෙවලම් හා ලීබඩු ඇතුළත් වත්කම් ඉවත් කිරීම් සඳහා තීරණය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

1996 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා කාලය තුළ විදේශ ආයතනවලින් පුස්තකාල පොත්, රසායන ද්‍රව්‍ය සහ වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා එම ආයතන වෙත රු.220,892 ක වටිනාකමින් යුතු අත්තිකාරම් 09 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම උපකරණ හෝ පොත් ගෙන්වා ගැනීමට කටයුතු නොකර ඉදිරියට ගෙන එන අත්තිකාරම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

තවද මෙම පොත් හා භාණ්ඩ තවදුරටත් ලබා ගැනීම අපහසු වීමෙන් එය අරමුදලට සිදු වූ පාඩුවක් බැවින්, එම පාඩුව අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත 2011 අගෝස්තු 31 දින සිට පවරා දී ඇති රයිසෝබියම් ව්‍යාපෘතිය යටතේ සෝයා බෝංචි සඳහා වූ රයිසෝබියම් ආමකුලක නම් වූ දියර පොහොර විශේෂයට අදාළ ව්‍යාපෘතිය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්වයං අරමුදලක් ලෙස ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියෙහි ලැබෙන ආදායම රයිසෝබියම් ව්‍යාපෘති අරමුදල නමින් පවත්වා ගෙන යන අතර, මෙම ව්‍යාපෘතියෙහි, ව්‍යාපෘති ප්‍රධානියා සහ පර්යේෂණ සහකරු ලෙස සේවය කරන නිලධාරීන් දෙදෙනා හට සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ ප්‍රතිපාදනවලින් රු. 884,847 ක වැටුප් ගෙවා තිබුණි.

(ආ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ නව සොයා ගැනීම් රටේ පොදු මහජන උන්නතිය සඳහා කාර්යක්ෂමව යොදා ගැනීමට නම් පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස සොයා ගන්නා ලද රයිසෝබියම් ආමකුලක පොහොර නිෂ්පාදනය සඳහා ගන්නා කොහුබත් රෝපණ මාධ්‍ය සඳහා පේටන්ට් බලපත්‍රය ආයතනය වෙත ලබා ගැනීමට වගකිවයුතු නිලධාරීන් විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. පේටන්ට් බලපත්‍රයක් නොමැති වීම නිසා ආයතනයේ නිෂ්පාදන වෙළඳපලට සෘජුව අලෙවි කිරීම වෙනුවට ආයතන 03 ක් මඟින් අලෙවි කිරීම තුළින් සමාලෝචිත වර්ෂය තුළදී රු.390,814 ක ඇස්තමේන්තුගත ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි.

**4.4** අරමුදල් ඌන උපයෝජනය

ආයතනයේ විශේෂ යෝජනා 07 ක් සඳහා ලැබී තිබුණු රු. 747,089 ක ප්‍රතිපාදිත මුදල් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් මුද්‍රණය කර දිගු කාලයක සිට අලෙවි නොවී පවතින පොත් සහ ප්‍රකාශනවල වටිනාකම රු.151,880 ක් වී තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී රු. 2,360,000 ක් වැය කර ඉදිකරන ලද හරිතාගාරය උපරිම කාර්යක්ෂමතාවයකින්, ඵලදායීත්වයකින් හා ආර්ථිකභාවයකින් භාවිතයට ගැනීමට 2015 මාර්තු මස වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට රසායනික ද්‍රව්‍ය තොග ගබඩා හා තොග සමීක්ෂණ වාර්තා පරීක්ෂාවේදී අයිතම 77 කට අදාළව දීර්ඝ කාලීනව චලනය නොවන තොග රු.472,376 ක් සහ රු. 273,954 කින් යුතු සෙමින් චලනය වන රසායනික ද්‍රව්‍ය තොග අයිතම 53 ක්ද ගබඩා කර තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පෙර වර්ෂයේ විගණන විමසුම් මඟින් ආයතනයේ කළමණාකරණය අවධානය යොමු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත්, කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 3,773,821 ක්වූ ස්ථාවර වත්කම් අයිතම් 28 ක් භාවිතයට නොගෙන පවතින බැවින් ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන ඉවත් කිරීමට හෝ පාලනාධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

**4.6** කාර්ය මණ්ඩල පරිපාලනය
-------------------------------

2014 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු 23 ක් ඇති අතර ඉන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/1608 හා 2014 මැයි 29 දිනැති ලිපිය ප්‍රකාරව අනුමැතිය ලබා දී තිබුණත්, බඳවා ගැනීමේ පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන එසේ බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
---------------------------------------------

**5.1** ක්‍රියාකාරී සැලැස්ම
---------------------

සංයුක්ත සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටු කර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, සැලැස්මේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**5.2** අභ්‍යන්තර විගණනය
-------------------------

මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව, මුදල් කටයුතු පිළිබඳව ප්‍රමාණවත්වූද, කාර්යක්ෂමවූද, පරීක්ෂාවක් කිරීමට හැකිවනු පිණිස එක් එක් ගිණුම් වර්ෂය සඳහා ගිණුම් හා මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සියළු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර අභ්‍යන්තර විගණන කටයුතු සිදුකළ යුතු වුවද, 2014 වර්ෂය තුළ එවැනි අභ්‍යන්තර විගණන වැඩසටහනක් සකස් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි.

**5.3** කළමනාකරණයට වාර්තා ඉදිරිපත් කිරීම
---------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව, සෑම මසකට වරක් කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**5.4** විගණන කමිටු
-----------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව, විගණන කමිටුව මඟින් තම නිරීක්ෂණ, අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණු අතර, විගණන කමිටුවේ පහත සඳහන් කරුණු විෂය පථයට අදාල කරගෙන නොතිබුණි.

i. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම
ii. ආයතනය තුළ ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම්වලට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගැයීම් කිරීම
iii. රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මහ පෙන්වීම් පිළිබඳ සමාලෝචනය
iv. හඳුනාගත් පැරණි සෙමින් චලනය වන හා නිෂ්ක්‍රීය තොග හා වෙනත් අයිතමයන් සම්බන්ධ ප්‍රකාශ

**5.5 ප්‍රසම්පාදන සැලැස්ම**

**සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි රු.120,000,000 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, එහි පහත දුර්වලතා නිරීක්ෂණය විය.**

**(අ) අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර නොතිබුණි.**

**(ආ) ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ඇතුළත් විය යුතු අතර, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට නොවැඩි කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළයුතු වුවද, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි.**

**5.6 අයවැය ලේඛනමය පාලනය**

**2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මට අනුව, දීර්ඝ කාලීන පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළයුතු වුවද, පහත දැක්වෙන වෙනස්කම් නිසා අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන ඒකකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.**

**(අ) වැය විෂයයන් 23 කට අදාළව ඇස්තමේන්තුගත වියදම් හා තත්‍ය වියදම් අතර රු.7,377,000 ක විචලනයක් වූ අතර, එහි පරාසය සියයට 2 සිට සියයට 97 දක්වා විය.**

**(ආ) වැය විෂයයන් 03 ක් යටතේ වෙන් කළ රු.600,000 ක ප්‍රතිපාදනවලින් සියයට සියයක් ඉතිරි වී තිබුණි.**

**(ඇ) අයවැයගත ආදායම් ප්‍රභවයන්ට ඇතුළත් නොවූ ආදායම් ශීර්ෂ 04 කට අදාළව රු.764,500 ක ආදායම් සමාලෝචිත වර්ෂයේදී උපයා ගෙන තිබුණි.**

**(ඈ) විවිධ ආදායම් ප්‍රභවය යටතේ අයවැයගත ආදායම්, තථ්‍ය ආදායම් සමඟ සැසඳීමේදී, රු.90,000 ක ඌන ආදායම් ඇස්තමේන්තුවක් දක්නට ලැබුණි.**

**6. පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.**

**(අ) ගිණුම්කරණය**
**(ආ) සේවක ණය පරිපාලනය**
**(ඇ) පර්යේෂණ හා ප්‍රදාන**
**(ඈ) තොග පාලනය**